**සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගම - 2017**

**-----------------------------------------------------------**

සීමාසහිත ලංකා විදුලි (පුද්ගලික) සමාගමේ ("සමාගම") සහ එහි පරිපාලිතයන්හි ("සමූහය") 2017 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ ලාභ හෝ අලාභ සහ අනෙකුත් විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, හිමිකම් වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ පිළිවෙලින් මූල්‍ය ප්‍රකාශන සහ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මෙම විගණනයේදී, ප්‍රසිද්ධ වෘත්තියේ නියැලුණු වරලත් ගණකාධිකාරී සමාගමක සහාය මා විසින් ලබාගන්නා ලදි. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව ප්‍රකාරව සමාගමේ මෙහෙයුම් කටයුතු පිළිබඳව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කල යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් අධ්‍යක්ෂ මණ්ඩලයේ වගකීම

**--------------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම අධ්‍යක්ෂ මණ්ඩලයේ ("මණ්ඩලය") වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළ වන විගණන සාක්ෂි ලබාගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගේ අවදානම් තක්සේරු කිරීම්ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස සමාගමේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් සමාගමේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. අධ්‍යක්ෂ මණ්ඩලය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීම ද විගණනයට ඇතුළත් වේ.

මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 2. මූල්‍ය ප්‍රකාශන

------------------

### 2.1 මතය

------

මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බව මා දරන්නාවූ මතය වේ.

### 2.1.1 වෙනත් නීතිමය හා නියාමන අවශ්‍යතාවයන් පිළිබඳ වාර්තා කිරීම

--------------------------------------------------------------------------

2007 අංක 07 දරන සමාගම් පනතේ 163 (2) වගන්තියේ නියමය පරිදි, පහත සඳහන් කරුණු මම ප්‍රකාශ කරමි.

(අ) මතය සඳහා පදනම හා විෂය පථය සහ විගණනයේ සීමා කිරීම් ඉහත පරිදි දක්වනු ලැබේ.

(ආ) මාගේ මතය වනුයේ,

- විගණනය සඳහා අවශ්‍ය සියලු තොරතුරු හා පැහැදිලි කිරීම් මා විසින් ලබා ගන්නා ලද බවත්, මාගේ පරීක්ෂණයෙන් පෙනී යන අන්දමට සමාගම විසින් විධිමත් ගිණුම්කරණ වාර්තා පවත්වා ඇති බවත්,

- මූල්‍ය ප්‍රකාශනවලින් 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය සහ මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කරන බවත්,

- සමාගමේ මූල්‍ය ප්‍රකාශන 2007 අංක 07 දරන සමාගම් පනතේ 151 සහ 153 වගන්තිවල අවශ්‍යතාවයන්ට අනුකූලව ඉදිරිපත් කර ඇති බවත්ය.

## 3. මූල්‍ය සමාලෝචනය

----------------------

### 3.1 මූල්‍ය ප්‍රතිඵලය

---------------

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2017 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සමූහයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු.2,281,690,000 ක බදු පෙර ශුද්ධ ලාභයක් වූ අතර ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ බදු පෙර ශුද්ධ ලාභය රු.2,266,799,000 ක් වූ බැවින්,පසුගිය වර්ෂයට සාපේක්ෂව රු.14,891,000 ක හෙවත් සියයට 0.6ක වැඩිවීමක් පෙන්නුම් කෙරුණි.

## 4. මෙහෙයුම් සමාලෝචනය

--------------------------

### 4.1 මානව සම්පත් කළමනාකරණය

--------------------------------

මණ්ඩලය විසින් අනුමත කරන ලද 2017 දෙසැම්බර් 31 දිනට සමාගමේ අනුමත සහ තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිවෙලින් 1,649 ක් සහ 1,575 ක් විය. එබැවින් තනතුරු 74 ක් පුරප්පාඩු වී තිබුණි. කෙසේ වුවද, අංක පීඊඩී/12 දරන 2003 ජුනි 02 දිනැති රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 9.3.1 වගන්තිය ප්‍රකාරව සමාගම විසින් මුළු කාර්ය මණ්ඩලයම ආවරණය වන පරිදි අනුමත කරන ලද විධිමත් බඳවා ගැනීමේ පරිපාටියක් පිළියෙල කර නොතිබුණි.

## 4.2 කළමනාකරණ ක්‍රියාකාරකම්

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

(අ) සීමාසහිත ලංකා විදුලි (පෞද්ගලික) සමාගම විසින් විදුලි බලය මිලදී ගැනීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය සමග විධිමත් ගිවිසුමකට එළඹ නොතිබුණි.

(ආ) ගිණුම්කරණ සහ මෙහෙයුම් ක්‍රියා පරිපාටි අත්පොත් යාවත්කාලීන කිරීම සඳහා 2002 වර්ෂයේ සිට කටයුතු කර නොතිබුණි.

(ඇ) සීමාසහිත ඇන්ටි ලෙකෝ (පෞද්ගලික) සමාගමේ වර්ෂ 3කට පෙර ආයෝජනය කරන ලද රු. මිලියන 47.1 ක් සඳහා වූ ලාභාංශ ලැබී තිබුණද, කොටස් සඳහා වෙන්කිරීම් කර නොතිබුණු අතර සමාලෝචිත වර්ෂයේ අවසානය දක්වාම කොටස් සහතික ද ලැබී නොතිබුණි.

(ඈ) සමාගම විසින් රු.මිලියන 20ක් ලංකා බ්‍රෝඩ්බෑන්ඩ් (පෞද්ගලික) සමාගමේ කොටස්වල ආයෝජනය කර තිබුණද, රු.මිලියන 5ක් වටිනා සාමාන්‍ය කොටස් සඳහා වූ කොටස් සහතික විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. තවත් රු. මිලියන 20ක ආයෝජනයක් 2017 දෙසැම්බර් 31 දිනට වූ මූල්‍ය ප්‍රකාශනවල සම්පූර්ණයෙන්ම හානිකරණයක් ලෙස දක්වා තිබුණි.

(ඉ) සමාගම සතු දේපළක් පරිහරණය කිරීම වෙනුවෙන් වූ රු.5,457,292 ක මුදලක් සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පෞද්ගලික) සමාගමෙන් ලැබිය යුතු කුලී ආදායමක් ලෙස සමාගම විසින් හඳුනාගෙන තිබුණි. කෙසේ වුවද, සමාගම මේ සම්බන්ධයෙන් සීමාසහිත ඇන්ටි ලෙකෝ මීටරින් (පෞද්ගලික) සමාගම සමග ගිවිසුම්ගත වී නොතිබුණි.

## 5. තිරසර සංවර්ධනය

එක්සත් ජාතීන්ගේ තිරසර සංවර්ධනය පිළිබඳ " 2030 න්‍යාය පත්‍රයට" අනුව, සියළුම රාජ්‍ය ආයතන විසින් තම විෂය පථය යටතේ වන අරමුණු සහ කාර්යයන් ඉටු කරගැනීම සඳහා දායකත්වය ලබා දිය යුතුය. කෙසේ වුවද, සමාගම තිරසර සංවර්ධන අරමුණු පිළිබඳව දැනුවත් වී නොතිබුණු අතර ළඟා කරගත යුතු ඉලක්ක, එම අරමුණු ළඟා කරගැනීමේදී ඇති වන ගැටළු සහ ප්‍රගතිය මැන බැලීම සඳහා සුදුසු නිර්ණායකයන් ද හඳුනාගෙන නොතිබුණි.